# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල **සේවය තහවුරු කරන ලද** ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ගෙන සකස් කළ අයදුම්පත් අදාළ සහතිකවල ඡායාපිටපත් ද සමඟ තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරි/අධ්‍යක්ෂ මඟින් 2026.08.05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ** යන ලිපිනයට එවිය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි බව, සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

## 01. නිවාස භාරකරු සහ අරක්කැමි (III ශ්‍රේණිය)

සුදුසුකම් :- 1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

3. ප්‍රාථමික මට්ටමේ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම.

වැටුප් පරිමාණය : රු. **44,575 -16x490 - 52,415 (මාසික) U-PL 2(III)**

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**02. රියදුරු (III ශ්‍රේණිය)**

සුදුසුකම් :- 1. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

සහ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කරන ලද සහ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත සේවකයෙකු වීම.

වැටුප් පරිමාණය : රු. **48,005 -16x490 - 55,845 (මාසික) U-PL 3(III)**

බඳවා ගැනීම : වෘත්තිය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**03. කළමනාකරණ සහකාර (ගබඩා පාලන) III ශ්‍රේණිය**

සුදුසුකම් :- 1. අ.පො.ස. (සා.පෙළ) විභාගය සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක්වරක දී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

3. ගබඩාකරණය පිළිබඳ වසරක පළපුරුද්ද සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

සටහන :- 1. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගතහැකි සුදුසුකමක් සහ පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

2. විශ්වවිද්‍යාලය විසින් නිශ්චය කරනු ලබන පරිදි තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂණ තැන්පතුවක් තැබිය යුතුය.

වැටුප් පරිමාණය : රු. **49,475 -17x540 - 58,655 (මාසික) U-MN 1 (III)**

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**04. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය**

සුදුසුකම් :- 1. අ.පො.ස. (සා.පෙළ) විභාගය සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක්වරක දී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරකදී ගණකාධිකරණය ඇතුළුව සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සටහන :- 1. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් සහ පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

2. විශ්වවිද්‍යාලය විසින් නිශ්චය කරනු ලබන පරිදි තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂණ තැන්පතුවක් තැබිය යුතුය.

වැටුප් පරිමාණය : රු. **49,475 -17x540 - 58,655 (මාසික) U-MN 1 (III)**

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**05. තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) 'ආ' ඛණ්ඩය**

සුදුසුකම් :- 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම.

හෝ

2. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකට (06) සාමාර්ථ සහිතව විභාගය සමත්වීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර අටක (08) ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

3. උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායක තනතුරක වසර පහළොවක (15) ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

වැටුප් පරිමාණය : රු. **51,095 -7x540; 10x640- 60,575 (මාසික) U-MT 1 (III)**

බඳවා ගැනීම : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**06. පරිගණක ක්‍රියාකරු (II ශ්‍රේණිය)**

සුදුසුකම් :- 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භෞතික විද්‍යාව හෝ විද්‍යාව සහ ගණිතය යන විෂයයන් දෙක ඇතුළත්ව සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම.

සහ

2. පරිගණක ක්‍රියා කරවීම සම්බන්ධයෙන් වසර දෙකකට නොඅඩු පළපුරුද්ද හෝ විද්‍යුත් කාර්මික උපකරණ භාවිතය, අළුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳව වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. **51,095 -7x540; 10x640- 60,575 (මාසික) U-MT 1 (III)**

බඳවා ගැනීම : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**07. තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය**

සුදුසුකම් :- 1. අ.පො.ස. (උ.පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත්ව තිබීම.

සහ

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණ/තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයකින් හෝ නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය නිපුණතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

සටහන :- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය : රු. **51,095 -7x540; 10x640- 60,575 (මාසික) U-MT 1 (III)**

බඳවා ගැනීම : ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**08. දත්ත පරිපාලක (II ශ්‍රේණිය)**

සුදුසුකම් :- 1. i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම.

ii) පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. උසස් අධ්‍යාපන ආයතනයක U-MN 1 හෝ U-MT 1 හෝ ඊට ඉහළ වැටුප් කාණ්ඩයක තනතුරක් දරන පරිගණක ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්දක් ඇති අයෙකු වීම.

හෝ

3. උසස් අධ්‍යාපන ආයතනයක පරිගණක ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක් දරන එම තනතුරෙහි අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අයෙකු වීම. එම සේවා කාලයට පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් ඇතුළත් විය යුතුය.

වැටුප් පරිමාණය : රු. **71,365 -18x1,190- 92,785 (මාසික) U-MN 3 (II)**

බඳවා ගැනීම : පරිගණක වැඩසටහන්කරණය ඇතුළත් පරිගණක කුසලතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

2025.07.11 දිනැතිව පළ කරන ලද දැන්වීමට අනුව පරිගණක ක්‍රියාකරු (II ශ්‍රේණිය), තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය හා දත්ත පරිපාලක (II ශ්‍රේණිය) යන තනතුරු සඳහා අයදුම් කළ අය **නැවත අයදුම් කරන** ලෙස කාරුණිකව දන්වමි.

**සැලකිය යුතුයි : මෙම තනතුරුවලට බඳවා ගැනීමේ දී වැටුප් පිහිටුවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය-2023 හි VI වන පරිච්ඡේදයේ 6.5 හා 26 උප වගන්ති අනුව වේ.**

වැඩබලන ලේඛකාධිකාරි